# 10 ශ්‍රේණිය සිංහල සාහිත්‍ය රසාස්වාදය

# උත්තරෙන්

## 08 ඒකකය



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

{ආදර්ශ ප්‍රශ්න, පසුගිය විභාග ප්‍රශ්න, පළාත් ප්‍රශ්න විචාර සහ පිළිතුරු අන්තර්ගත කර ඒකකය සම්පූර්ණයෙන් ම ආවරණය කර ඇත.}

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 08. උතුරෙන්

- **විචාර ලිවීමේදී හැඳින්වීම**

✓ නූතන යුගයේ මුල් පරපුරට අයත් වන ජනප්‍රිය කවීන් කිහිපදෙනා අතර ප්‍රමුඛයකු වූ සාගර පලන්සූරිය කවියා 'කේයස්' යන අන්වර්ථ නාමයෙන් පුවත්පත් හා සඟරා සඳහා නිර්මාණ ඉදිරිපත් කළ සුලභ කල්පනා ලෝකයක් මැවූ කවියෙකි. කාව්‍ය නිර්මාණ සඳහා විදේශ කාව්‍ය නොමඳ ව ඇසුරු කළා වූ යුගයක ඇතැම් කවීන් මෙන් ජීවිතයේ ශෘංගාරාත්මක හා ප්‍රේමණීය පක්ෂය නිරූපණය කිරීමට වඩා කේයස් යොමු වූයේ මානව දයාව හා ප්‍රේමය කුළුගැන්වීම කෙරෙහි ය. පවත්නා සමාජ ක්‍රමය පිළිබඳ සියුම් විරෝධාකල්පමය මතවාදයක් කුළුගැන්වෙන මොහුගේ ඞඋතුරෙන්ඞ පද්‍ය පංතිය සඳහා තේමාව වී ඇත්තේ ශ්‍රී ලංකාද්වීපයේ උතුරු දේශයේ මිනිසුන් හා දකුණු ලක මිනිසුන් දෙපිරිසම එකම පවුලක පිරිසක් බව අවධාරණය කිරීමයි. 'සාගර පලන්සූරිය' කවියා ජීවත් වූ සමයේ උතුර දකුණ අතර යුධමය තත්ත්වයක් තිබුණේ නැත. එහෙත් අළු යට ගිණි පුපුරක් සේ එකිනෙකා අතර සැකය සහ බිය මෝදුවෙමින් පැවතුණි. ඉන් අනතුරුව හටගත් ජාතිවාදී අරගලය දශක තුනක් පමණ පුරා පැවතුණි. යුද්ධයට පෙර රචනා වූ මෙම පද්‍ය පන්තියේ වටිනාකම ඇත්තේ එදාට වඩා අද ය. උතුරු-දකුණ සහජීවනය සඳහා මෙම පද්‍ය පංතියෙන් මහඟු සේවාවක් ඉටු වෙයි. ඒ පිළිබඳ විමසා බලන විට කවියා උතුරු-දකුණු සුහදතාව අපේක්ෂාවෙන් මෙම පැදි පෙළ රචනා කොට ඇති බව සිතිය හැකිය.

- **අදර්ශ විචාර ප්‍රශ්න**

1. 'උතුරෙන්' කාව්‍ය නිර්මාණයට පාදක වී ඇති තේමාව විග්‍රහ කරන්න. (ලකුණු 10)

2. උතුරෙන් පැදි පෙළ කාලීන වටිනාකමකින් යුක්ත නිර්මාණයකි. ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 10)

3. සිය නිර්මාණය සඳහා සාගර පලන්සූරිය යොදා ගෙන ඇති කාව්‍යෝක්ති එහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති ආකාරය විමසන්න. (ලකුණු 10)

- **ආදර්ශ කවි**

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නැගියි උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයක දි එකට හමු වන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමු වේවා දකුණ

ඞහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී

- **පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - ව්‍යුහගත හා කෙටි ප්‍රශ්න**

1.

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

i. මෙම කවිය ඇතුලත් පැදි පෙළේ රචකයා කවරෙක් ද? (ලකුණු 02 යි)
ii. පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින් කියන්න මතු කරන අර්ථය කුමක් ද? (ලකුණු 02 යි)

2017 o/L)

2.

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නඟියි උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ

ගෙන එයි මිහිරි ගී මඳනල හමන විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය මත
උගතිමි කිම ද මිනිසා සතු දෙ නෙත

ඔහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයක දී එකට හමු වන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමු වේවා දකුණ

i. මෙම පද්‍ය පන්තිය නිර්මාණයේ දී කවියාගේ අපේක්ෂාව වූයේ කුමක් ද? (ලකුණු 05 යි)

ii. තම අත්දැකීම් ප්‍රබල ව ඉදිරිපත් කිරීමේදී පරිසර වර්ණනා යොදා ගත් ආකාරය පහදන්න. (ලකුණු 05 යි)

iii. උතුරෙත් දකුණෙත් දැකිය හැකි පොදු සමානතා මොනවා ද? (ලකුණු 05 යි)

iv. 'මෙම පද්‍ය පන්තියෙන් කවියා විසින් අපේක්ෂා කරන ලද්දේ ජාතික සමගියයි' විමසන්න.
(ලකුණු 05 යි)
(2019 o/L)

3.

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නඟියි උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ

ගෙන එයි මිහිරි ගී මඳනල හමන විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොලොව පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය මත
උගතිම් කිම ද මිනිසා සතු දෙ නෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයක දි එකට හමු වන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමු වේවා දකුණ

i. මෙම මෙම පද්‍ය පන්තිය සඳහා පාදක වී ඇති තේමාව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

ii. මෙම පද්‍ය පන්තියෙහි ආකෘතිය නම් කර එහි ඇතුළත් ආකෘතික ලක්ෂණ දෙකක් දක්වන්න.
(ලකුණු 05 යි)

iii. උතුරෙන් පැදි පෙළ කාලීන වටිනාකමකින් යුක්ත නිර්මාණයක් බව සනාථ කිරීමට ඔබේ අදහස් දක්වන්න.
(ලකුණු 05 යි)

iv. මෙම පද්‍ය පන්තියෙහි අන්තර්ගත කාව්‍ය අලංකාර තුනක් උදාහරණ සහිතව දක්වන්න.
(ලකුණු 05 යි)

v. මෙම කවියාගේ ප්‍රාර්ථනය කුමක් ද? යන්න පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.
(ලකුණු 05 යි)
(ලකුණු 25 යි)
(2019 NW 2nd Term)

4. ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නොව උණුවී හැළෙන ඉටී

i. මෙම කවිය ඇතුළත් පද්‍ය පන්තිය රචකයා නම් කරන්න. (ලකුණු 02 යි)
ii. ''කළුගල් යකඩ නොව උණු වී හැළෙන ඉටී'' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 02 යි)
(2019 NW 3rd Term )

5.

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නඟියි උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ

ගෙන එයි මිහිරි ගී මඳනල හමන විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය මත
උගතිමි කිම ද මිනිසා සතු දෙ නෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයක දි එකට හමු වන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිලිස්සී හමු වේවා දකුණ

i. කවි පෙළ සඳහා වස්තු විෂයය කරගෙන ඇත්තේ කුමක් ද? (ලකුණු 05 යි)

ii. පද්‍ය පන්තිය සඳහා කවියා උපයුක්ත කරගෙන ඇති භාෂාව පිළිබඳව ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

iii. සමාජයේ යහපත්ව අදින පුරවැසියෙකු ලෙස ජීවත් වීමේ දී හැඩ ගසා ගත යුතු ගුණාංග පැදි පෙළෙන් ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව කෙටියෙන් කරුණු දක්වන්න. (ලකුණු 05 යි)

iv. කවි පෙළ සාර්ථක නිර්මාණයක් බවට පත්කර ගැනීම සඳහා කවියා යොදාගෙන තිබෙන කාව්‍යෝපක්‍රම ඉවහල් වූ ආකාරය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10 යි)

(2020 NW 1st Term)

- **<u>පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - ව්‍යුහගත හා කෙටි ප්‍රශ්න පිළිතුරු</u>**

1. (2017 o/L)

I. සාගර පලන්සූරිය මහතා.

II. පටු ජාතිවාදී අදහස් නමැති පවුරු පදනම් බිඳිමින් උතුරු-දකුණ යා කරන අත්වැලක් කවදා හෝ නිර්මාණය වනු ඇතැයි යන්න.

2. (2019 o/L)

I.

- ✓ සිංහල සහ දෙමළ ජනතාව අතර අනවබෝධය නිසා ඇති වන දුරස්ථභාවය පිළිබඳ කවියා බලවත් පසුතැවිල්ලට පත් ව ඇත.
- ✓ පරිසරය හා සමාජ ජීවිතය සලකා බලන විට ඇත්තේ බෙහෙවින් සමානතා ය.
- ✓ සියලු ආකාරයෙන් සම වූ ජාතීන් දෙක අතර ඇති මේ දුරස්ථභාවය සමාජ ප්‍රගතියට අයහපත් ලෙසින් බලපාන බැවින් එම දුර්වලතා මගහරවා ගැනීම සඳහා කවියා තම නිර්මාණය යොදා ගැනීමට උත්සාහ දරයි.

පූර්වෝක්ත කරුණු ආශ්‍රයෙන් අදාළ පිළිතුර සපයා තිබීම අවශ්‍ය වේ.

II. කවියා බලාපොරොත්තු වන්නේ වර්තමානයේ අනවබෝධය නිසා ඇතිවන අසමගිකම් දුරු වී ජාතීන් අතර සමගිය වර්ධනය වීම ය. ඒ සඳහා කවියා මේ ප්‍රදේශ දෙකෙහි ඇති සමාන අසමානකම් දැක්වීමට පරිසර වර්ණනා යොදා ගනියි. හිරු උදාවීම, සඳ හා තරු පායා ඒම, මදනල හැමීම ආදි සොබා දහමේ සිදුවීම් මෙහි දී යොදා ගෙන ඇත.

උදා : **''රන්තරු රිදී තරු සවසට පෙළට ඇදේ''**
**''හඳ ඇති දාට රසබර රැස් දහර හදේ''**
**''පොල්ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ''**
**''ගෙන එයි මිහිරි ගී මද නල හමන විට''**
**''උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට''**

යනාදි ලෙසින් පරිසර වර්ණනා යොදා ගෙන ඇති අයුරු දැක්විය යුතු ය.

III. සොබා දහමේ සිදුවීම් උතුරට හා දකුණට වශයෙන් වෙනසක් නොවීම

**''දකුණේ මෙන්ම උතුරෙත් හිරු නගියි උදේ**
**රන්තරු රිදී තරු සවසට පෙළට ඇදේ ''**

**''ඔහදිය හෙළන අය හිරිහැර අතර වැටී**
**දකුණේ මෙන් ම උතුරෙත් හැම තැන ම සිටී''**

උතුරේ මෙන් ම දකුණෙත් එකසේ දුක් විඳින මිනිසුන් සිටීම. ඒ හැම දෙනාගේ ම සිත් තුළ අනුකම්පාව, සංවේදීබව පැවතීම පොදු ලක්ෂණයකි.

IV.

- ✓ සිංහල හා දෙමළ ජනතාව අතර ජාතික සමගියේ අවශ්‍යතාව අවධාරණය කරන කවියා ඒ සඳහා පරිසරයේ හා මානව වර්ගයාගේ සමානතා උපුටා දක්වමින් තම අත්දැකීම ඉදිරිපත් කරයි. සියලු ජාතීන්ට පායන්නේ එක ම හිරු හා සඳු ය. හමා යන්නේ එක ම සුළඟ ය.

- ✓ මානව චර්යා දෙස බලන විට දමිළ ජනයාගේ දයාන්විත බව, අනුන් උදෙසා ඔවුන්ගේ නෙත් තෙත් වන බව ජාතික සමගියට වූ මනා එළඹුමක් බව අවධාරණය කරයි.
- ✓ උතුරේත් දකුණේත් සාමාන්‍ය ජනයා එනම් ශ්‍රමය වැයකරන කම්කරු ආදින්ගේ ළතෙත් බව හා පොදුවේ ඔවුන් විඳින ගැහැට දුරු කිරීමේ මග වන්නේ ද ජාතික සමගිය බව කවියා අදහස් කරයි.
- ✓ උතුර හා දකුණ අතර ඇති භේදය බිඳ දැමීම සඳහා ජනතා බලවේගයක් ඇති විය යුතු බවට කෙරෙන අවධානය කවියාගේ අපේක්ෂාව පැහැදිලි කරයි.

මේ සඳහා අවශ්‍ය නිදර්ශන පද්‍ය පන්තිය ඇසුරෙන් දක්වා තිබීම අවශ්‍ය වේ.

3. (2019 NW 2nd Term)

I. උතුරෙ දකුණෙ මිනිසුන් අතර පවත්නා අසමගිය.

II. සැදැස් ආකෘතිය.
- ✓ එළිවැට ආරක්ෂා වී තිබීම.
- ✓ පද හතරකින් යුක්ත වීම.
- ✓ තාලයට ගායනා කළ හැකි වීම.

III. භේදවලින් තොරව සියලු දෙනා එක් ව සමගිවසිටීමේ වටිනාකම ප්‍රකාශ කරමින් එහි කාලීන වටිනාකම දක්වා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

IV. සංකේත භාවිතය<br>
ව්‍යංගාර්ථ භාවිතය<br>
සරල බස

V. ජාති භේදයකින් තොරව දකුණේ සියලු වැසියන් සමගියෙන් සිටීම.

4. (2019 NW 3rd Term)

I. සාගර පලන්සූරිය මහතා.

II. දරුණු මිනිසුන්ගේ ද හදවත් උණුවෙන බව

5. (2020 NW 1st Term)

I. අපේ රටේ කලක සිට පැවති ජාතිභේද අරගලය නිසා බෙදී වෙන්ව ගිය සිංහල දෙමළ ජනයා නැවත එක් කිරීමේ අරමුණ මෙහි වස්තු විෂය වී ඇත. එකමුතුකමින් සමගියෙන් සිටි ජනතාව යම් පිරිසකගේ උවමනාවන් නිසා ඇති වූ පටු අරමුණු නිසා භේද විය. එකම රටේ ජනතාව නොබෙදී එක්ව සිටීමේ අගය මින් පැහැදිලි කර දෙයි. කවියාගේ එම අරමුණ මෙසේ දැක්විය හැකි ය.

**සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන**<br>
**බේදය පිළිස්සී හමු වේවා දකුණ**

II. කවියා මෙහිදී සරල භාෂාව උපයෝගී කොට ගෙන ඇත.

**ගෙන එයි මිහිරි ගී මදනල හමන විට**<br>
**වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු මට**

ඊට නිදසුනකි.

III. මිනිසුන් අතර භේද භින්නතා ඇති කිරීමට යම් යම් පුද්ගලයන් උත්සාහ කරන විට එම උගුල්වලට හසු නොවී තම සිතිවිලි අදීනව තබාගත යුතු ය. ජාතීන් අතර සමගිය ගොඩ නගා ගනිමින් එකමුතුව සිටිය යුතු ය. තම ආකල්ප ඒ සඳහා හැඩගස්වා ගත යුතු ය.

IV. 'උතුරෙන්' පද්‍ය පන්තිය රචනා කිරීමේ දී කවියා යොදාගෙන ඇති කාව්‍ය උපක්‍රම නිදසුන් තුළින් පැහැදිලි කර දැක්විය හැකි ය. ඉන් එක් උපක්‍රමයක් වන්නේ රූපක භාවිතය යි.

**බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට**

විලංගුව පා මිණි සලඹ රූපකාථවත් පදයකි.

**ගෙන එයි මිහිරි ගී මඳනල හමන විට**<br>
**උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට**

ගී මඳනල, පිනිබිඳු පබලු ඇට රූපකාර්ථවත් පදවැල් ය. එමෙන්ම සංකේතාර්ථවත් පද යොදා ගැනීම ද දැකිය හැකි ය.

**පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ**

පොල් ගස්, තල්ගස් ජාතීන් සංකේතවත් කරන පද වේ. එමෙන්ම ව්‍යංගාර්ථවත් පද යොදා ගැනීම ද දැකිය හැකි ය.

**මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත**<br>
**සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන**<br>
**බේදය පිළිස්සී හමු වේවා දකුණ**<br>
**පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්**

මේ අයුරින් විවිධ කාව්‍යෝපක්‍රම යොදා ගනිමින් තම අරමුණු ඉටු කර ගැනීමට එය මහඟු පිටිවහලක් කරගනිමින් කවියා සාර්ථක පද්‍ය පන්තියක් නිර්මාණය කර ඇත.



හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

## 01. 'උතුරෙන්' කාව්‍ය නිර්මාණයට පාදක වී ඇති තේමාව විග්‍රහ කරන්න. (ලකුණු 15)

නූතන යුගයේ මුල් පරපුරට අයත් වන ජනප්‍රිය කවීන් කිහිපදෙනා අතර ප්‍රමුඛයකු වූ සාගර පලන්සූරිය කවියා 'කේයස්' යන අන්වර්ථ නාමයෙන් පුවත්පත් හා සඟරා සඳහා නිර්මාණ ඉදිරිපත් කළ සුලභ කල්පනා ලෝකයක් මැවූ කවියෙකි. කාව්‍ය නිර්මාණ සඳහා විදේශ කාව්‍ය නොමඳ ව ඇසුරු කළා වූ යුගයක ඇතැම් කවීන් මෙන් ජීවිතයේ ශෘංගාරාත්මක හා ප්‍රේමණීය පක්ෂය නිරූපණය කිරීමට වඩා කේයස් යොමු වූයේ මානව දයාව හා ප්‍රේමය කුළුගැන්වීම කෙරෙහි ය. පවත්නා සමාජ ක්‍රමය පිළිබඳ සියුම් විරෝධාකල්පමය මතවාදයක් කුළුගැන්වෙන මොහුගේ ඞඋතුරෙන්ඞ පද්‍ය පංතිය සඳහා තේමාව වී ඇත්තේ ශ්‍රී ලංකාද්වීපයේ උතුරු දේශයේ මිනිසුන් හා දකුණු ලක මිනිසුන් දෙපිරිසම එකම පවුලක පිරිසක් බව අවධාරණය කිරීමයි. 'සාගර පලන්සූරිය' කවියා ජීවත් වූ සමයේ උතුර දකුණ අතර යුධමය තත්ත්වයක් තිබුණේ නැත. එහෙත් අළු යට ගිණි පුපුරක් සේ එකිනෙකා අතර සැකය සහ බිය මෝදුවෙමින් පැවතුණි. ඉන් අනතුරුව හටගත් ජාතිවාදී අරගලය දශක තුනක් පමණ පුරා පැවතුණි. යුද්ධයට පෙර රචනා වූ මෙම පද්‍ය පන්තියේ වටිනාකම ඇත්තේ එදාට වඩා අද ය. උතුරු-දකුණ සහජීවනය සඳහා මෙම පද්‍ය පංතියෙන් මහඟු සේවාවක් ඉටු වෙයි. ඒ පිළිබඳ විමසා බලන විට කවියා උතුරු-දකුණු සුහදතාව අපේක්ෂාවෙන් මෙම පැදි පෙළ රචනා කොට ඇති බව සිතිය හැකිය.

**දකුණේ මෙන් ම උතුරෙත් හිරු නඟියි උදේ**<br>
**රන් තරු රිදී තරු සවසට පෙළට ඇදේ**<br>
**හඳ ඇති දාට රසබර රැස් දහර හදේ**<br>
**පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ**

පලන්සූරිය කවියා උතුරු-දකුණ වෙනසක් නොමැතිව සම සමව පවතින බව අපට අවධාරණය කළේ පරිසරය ද ඈඳා ගනිමිනි. උදයට උතුරේත් දකුණේත් වෙනසක් නොමැතිව සමසමව හිරු නඟියි. රන් තරු රිදී තරු ද වෙනසක් නොමැති ය. සඳ පහන් රැයක පරිසර දෙකම එක ලෙස සඳ කිරණෙන් නැහැවේ. සරලව පවසතොත් පොල් ගසටත් තල් ගසටත් සම සමව සඳ එළිය වැටෙ යි. භූමිය බෙදා ගැනීමටත් අමානුෂික ලෙස වෛරයෙන් බැඳීමටත් එරෙහිව කවියා ප්‍රභලව පොල් ගසත් සල්ගසත් දෙක යොදා ගනි යි.  ඒ අනුව පොල් ගස දකුණත් තල් ගස උතුරත් නියෝජනය කරන සංකේත බඳු ය. මෙයින් තවදුරටත් ව්‍යංගාර්ථවත් වනුයේ එකම රටක ස්වභාවික පරිසරයේ වෙනසක් මිස සෞන්දර්යයේ අඩුවක් නොමැති බව යි.

**මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්**<br>
**බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු විසින්**<br>
**ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්**<br>
**පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්**

පටු ජාතිවාදී අදහස් නමැති පවුරු පදනම් බිඳිමින් උතුරු-දකුණ යා කරන අත්වැලක් කවදා හෝ නිර්මාණය වනු ඇතැයි යන්න කවියාගේ පරමාර්ථය බව මෙම කවියෙන් ගම්‍යමාන වන අර්ථය යි.

**පැයක දි එකට හමු වන දුර ඇත දෙතැන**<br>
**මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද කොතැන**<br>
**සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන**<br>
**බේදය පිළිස්සී හමු වේවා දකුණ**

උතුර හා දකුණ එකම රටක කොටස් දෙකකි එය කොටස් දෙකක් කීමටවත් බැරි තරම්ය. **'පැයකදී එකට හමුවන දුර'** යනුවෙන් කවියා එය ගම්‍යමාන කරයි. ඒවා එතරම් සමීපව පිහිටා ඇත. මෙය කාහටවත් බෙදා වෙන් කළ නොහැකි ය. එය අර්ථ ශූන්‍ය ක්‍රියාවකි. සිදුවිය යුත්තේ උතුර හා දකුණ වෙන් කිරීම නොව සහජීවනයෙන් දෙකොන තවත් යා කිරීම ය. මේ බැව් සනාථ කරන ආකාරය **'සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන - භේදය පිළිස්සී හමුවේවා දකුණ'** යන පද්‍ය පාද දෙක තුළින් චිත්‍රණය වේ. මෙලෙස කාලීන ජනවාර්ගික භේදය වැනි කාලීන ගැටලුවක් තේමා කරගනිමින් බෙදී ගියොත් රට වැනසෙන බවත් එක්සත් වුවහොත් රට සමෘද්ධිමත් වන බවත් කියාපාන කවියා ගේ, සර්වකාලීන වටිනාකමකින් යුත් පැදි පෙළක් ලෙස උක්ත **'උතුරෙන්'** පද්‍ය පන්තිය අගය කළ හැකි ය.

Hasitha hettiarachchi
071-9020298

## 02. 'උතුරෙන්' පැදි පෙළ කාලීන වටිනාකමකින් යුක්ත නිර්මාණයකි. ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 15)

නූතන යුගයේ මුල් පරපුරට අයත් වන ජනප්‍රිය කවීන් කිහිපදෙනා අතර ප්‍රමුඛයකු වූ සාගර පලන්සූරිය කවියා 'කේයස්' යන අන්වර්ථ නාමයෙන් පුවත්පත් හා සඟරා සඳහා නිර්මාණ ඉදිරිපත් කළ සුලභ කල්පනා ලෝකයක් මැවූ කවියෙකි. කාව්‍ය නිර්මාණ සඳහා විදේශ කාව්‍ය නොමඳ ව ඇසුරු කළා වූ යුගයක ඇතැම් කවීන් මෙන් ජීවිතයේ ශෘංගාරාත්මක හා ප්‍රේමණීය පක්ෂය නිරූපණය කිරීමට වඩා කේයස් යොමු වූයේ මානව දයාව හා ප්‍රේමය කුළුගැන්වීම කෙරෙහි ය. පවත්නා සමාජ ක්‍රමය පිළිබඳ සියුම් විරෝධාකල්පමය මතවාදයක් කුළුගැන්වෙන මොහුගේ 'උතුරෙන්'පද්‍ය පංතිය සඳහා තේමාව වී ඇත්තේ ශ්‍රී ලංකාද්වීපයේ උතුරු දේශයේ මිනිසුන් හා දකුණු ලක මිනිසුන් දෙපිරිසම එකම පවුලක පිරිසක් බව අවධාරණය කිරීමයි. 'සාගර පලන්සූරිය' කවියා ජීවත් වූ සමයේ උතුර දකුණ අතර යුධමය තත්ත්වයක් තිබුණේ නැත. එහෙත් අළු යට ගිනි පුපුරක් සේ එකිනෙකා අතර සැකය සහ බිය මෝදුවෙමින් පැවතුණි. ඉන් අනතුරුව හටගත් ජාතිවාදී අරගලය දශක තුනක් පමණ පුරා පැවතුණි. යුද්ධයට පෙර රචනා වූ මෙම පද්‍ය පන්තියේ වටිනාකම ඇත්තේ එදාට වඩා අද ය. උතුරු-දකුණ සහජීවනය සඳහා මෙම පද්‍ය පංතියෙන් මහඟු සේවාවක් ඉටු වෙයි. ඒ පිළිබඳ විමසා බලන විට කවියා උතුරු-දකුණු සුහදතාව අපේක්ෂාවෙන් මෙම පැදි පෙළ රචනා කොට ඇති බව සිතිය හැකිය.

**මිනිහා වෙතින් මිනිහා වෙන් කරන          රිසින්**
**බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු          විසින්**
**ඒවා කඩා බිඳගෙන එහි පිරුණු          පසින්**
**පාලම බැඳෙනු ඇත දවසක උතුරු          දෙසින්**

කේයස් තම කවි පෙළට තේමා කරගත්තේ තත්කාලීන ගැටලුවකි. එනම් ජන වාර්ගික භේදයයි. කවියාගේ අවධානය යොමුවන්නේ උතුරේත් දකුණේත් පැවති සහජීවනය විනාශ කලේ කවු ද? යන්න පිළිබඳව ය. මිනිසුන්ට භූමිය බෙදා ඒ බිම් කඩෙහි රජ වීමට අවශ්‍ය නොවේ. බිම් අඟලක් නැති මිනිසුන් රජකම පිළිබඳ සිටින නොපතයි. එහෙත් යස ඉසුරින් පිරි මිනිසුන් තම ආධිපත්‍ය සඳහා භූමිය ප්‍රාර්ථනය කරයි. සීමා මායිම් සලකුණු කරගෙන කිරුළු පළඳියි. ඒ සඳහා බළල් අතක් මෙන් යොදා ගන්නේ දුප්පත් අසරණයින් ය. කවර හෝ උපායකින් ඔවුන් ජයගෙන රාජ්‍යත්වය ලැබ දුප්පතුන් අමතක කරයි. එලෙස උතුරු - දකුණු වෙන්කොට පවුරු බඳින්නේ ඉසුරුබර දැන උගත් මිනිසුන් ය. පසු කලෙක ඒවාට වන්දි ගෙවිය යුත්තේ දුප්පතුන් ය. මෙය සදාකාලික ක්‍රියාදාමයකි.

බලයට පත්වන තුරුම උතුරේ - දකුණේ ඔටුණු පළඳන්නේ දුප්පතුන්ට ය. රජ වූ සැණින් එම ඔටුණු ඩැහැ ගෙන රජ බවට පැමිණෙන්නේ ඉසුරුබර මිනිසුන් ය. මේ පවුරු සැමදා බැන්දේ ඔවුන් ය. කවියා ඉතා සංක්ෂිප්තව මෙය ඉදිරිපත් කර ඇත. එය සමාජයේ සදාතනික සංසිද්ධියක් ලෙස ද නම් කළ හැකි ය. එහෙත් කවියා තුළ වර්ණවත් සිහිනයක් පවතියි. මේ බැඳි පවුරු සිඳ බිඳ උතුරේත් - දකුණේත් මිනිසුන් එක්ව පවුරු වෙනුවට පාලම් ඉදිකරනු ඇත ය යන්නයි.

**පැයක දී එකට හමු වන දුර ඇත          දෙතැන**
**මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද          කොතැන**
**සුරුට්ටුවට එක් වී උතුරේ          ඔතන**
**බේදය පිළිස්සී හමු වේවා          දකුණ**

උතුර හා දකුණ එකම රටක කොටස් දෙකකි එය කොටස් දෙකක් කීමටවත් බැරි තරමිය. **'පැයකදී එකට හමුවන දුර'** යනුවෙන් කවියා එය ගම්‍යමාන කරයි. ඒවා එතරම් සමීපව පිහිටා ඇත. මෙය කාහටවත් බෙදා වෙන් කළ නොහැකි ය. එය අර්ථ ශූන්‍ය ක්‍රියාවකි. සිදුවිය යුත්තේ උතුර හා දකුණ වෙන් කිරීම නොව සහජීවනයෙන් දෙකොන තවත් යා කිරීම ය. මේ බැව් සනාථ කරන ආකාරය **'සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන - භේදය පිළිස්සී හමුවේවා දකුණ'** යන පද්‍ය පාද දෙක තුළින් චිත්‍රණය වේ. උතුරේත් දකුණේත් බේද තුරන් වී විශ්වාසයෙන් බැඳෙන සහජීවනයක් හටගනු ඇතැයි අපේක්ෂා කරන කවියා මෙලෙස පාඨකයා තුළ ජනනය කරනන්නේ කාලීන වටිනාකමකින් යුත් අදහසකි.

**ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී**
**දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී**
**විමසා බලම් ඔවුනගෙ හදවතෙහි හැටී**
**කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී**

සැබවින්ම ජාති, කුල, ආගම් භේද දුප්පත් අසරණයන්ට ගැට ලු නොවේ. ඔවුන්ට එවන් භේද භින්නතා සලකමින් කල් මැරීමට ඉඩක් නොමැත. උතුරේත් දකුණේත් දුප්පතුන්ට අවශ්‍ය වන්නේ ජීවත්වීමට ය. ඔවුන්ගේ දරු පැටවුන්ට හෝ ජීවිතයක් ලබා දීමට ය. මෙම ජාතිවාදය අවශ්‍ය වන්නේ සුළු පිරිසකට ය. ඒ හුදු ආත්මාර්ථය උදෙසා ය. කවියා මෙය නිරවුල් කර දෙයි. දුප්පතුන් ලෙස හඳුනාගන්නේ දහඩිය හෙලන මිනිස්සුන් ය. ඔවුහු නොයෙකුත් හිරිහැර විඳිති. දකුණේත් උතුරේත් දුක් විඳින පිරිස් බහුල ය. ඕවුන් දෙපිරසගේ ම හදවත් කළුගල් නොවේ. එකිනෙකා වෙනුවෙන් උණු වන ඉටි මෙනි. එය මානව සංහතියේ යහපැවැත්ම සඳහා ඉතා උචිත ය. සාහිත්‍ය කලාව තුළින් ඉටු විය යුතු මෙහෙය වෛරය වැපිරීම නොව සංහිඳියාවයි. කවියා එම සංහිඳියාව ජන සමාජයට සංවේදීව කාන්දු කර ඇත.

මෙලෙස කාලීන ජනවාර්ගික භේදය වැනි කාලීන ගැටලුවක් තේමා කරගනිමින් බෙදී ගියොත් රට වැනසෙන බවත් එක්සත් වුවහොත් රට සමෘද්ධිමත් වන බවත් කියාපාන කවියා ගේ, සර්වකාලීන වටිනාකමකින් යුත් පැදි පෙළක් ලෙස උක්ත **'උතුරෙන්'** පද්‍ය පන්තිය අගය කළ හැකි ය.

Hasitha hettiarachchi
071-9020298



හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1